Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Please, Sir, we are not interested in the per captia income. In that care the rich are also included.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

The per capita income may be very high, but how many people are starving ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

The fact is that the classification should be above a particular quantity. You take the average. Find out who are the people who have become rich. Find out who are the people who have become rich under this Government. Why do you not look into that and give us a figure that way ? Why do you not expose your assests ? (*Interruption*). I would challenge you to come out with your assests. We as Members of Parliament have disclosed our assets. I would like that to go on record not only in Parliament but also in the press. Let us be clean that way. (*Interruption*).

I am sorry to say that we cannot agree with thsi type of machination of figures with regard to prices where the poor of this country are concerned. This will really cause the prices of imported commodit us to go up. And because you are not going to curb or control the price hike of Nestles the prices go up. Therefore let the Hon. Minister get up and say that he is going to control the Nestle prices. Then will agree with him.

ආර්. ජේ. ජී. ද මැල් මහතා
(திரு. ஆர். ஜே. ஜீ. த மெல்)
(Mr. R. J. G. de Mel)

It is a matter for the Hon. Minister of Rural Industrial Development.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Therefore I do not think we can agree to this increase because ultimately we know the price of milk will go up. Ultimately the Nestle Organization will be the beneficiary and it is teh poorer people who will have to pay to keep Nestle's going.

අනිල් මුණසිංහ මහතා (මතුගම)
(திரு. அனில் முனசிங்ஹ — மத்துகம)
(Mr. Anil Moonesinghe-Matugama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තීරු බදු වැඩි කිරීමේදී වැදගත් ප්‍රතිපත්ති කීපයක්ම අඩංගු වී තිබෙනවාය කියා මම හිතනවා. මේ ගරු සභාවේ මන්ත්‍රීතුමන්ලාට මේ වැඩ පිළිවෙළින් පෙනී යනවා ඇති, බහු ජාතික සමාගම් කොහොමද වැඩ කරන්නේ කියා. මේවා ගැන පොතපතත් ලියා තිබෙනවා. එක පාරටම එක බහු ජාතික සමාගමක් රටකට ඇතුළු වෙනවා. එහෙම ඇතුළු වී ඒ රටේ ආර්ථිකයේ එක කොටසක් අල්ලා ගන්නවා. මෙහි දෙපැත්තක් තිබෙනවා. මොකද, දන් නෙස්ලේ සමාගම ලංකාව අල්ලා ගන්නාට පසුව වෙනත් කාටවත් මෙතැනට එන්නට ඉඩ දෙන්නේ නැහැ.

මෙපමණ කාලයක් නෙස්ලේ සමාගමට සිද්ධ වුණා, අනිකුත් බහු ජාතික සමාගම් සමඟ තරග කරන්නට. දන් එහෙම නොවෙයි. දන් නෙස්ලේ සමාගමයි, ලංකාණ්ඩුවයි එකතු වී තමයි වැඩ කර ගෙන යන්නේ. එම නිසා මේ වෙළඳපොල සම්පූර්ණයෙන්ම නෙස්ලේ ගේ වෙළඳපොලක් වී තිබෙනවා. දන් නෙස්ලේ සමාගම මෙතැනට ආවේ කොහොමද ? මේ ආණ්ඩුව බලයට පත් වන කාලයේදී අපේ මුදල් ඇමතිතුමාම කිව්වා, ලංකාවේ ආර්ථිකයට නව නැම්මක් දී තිබෙනවාය කියා. මොකක්ද ඒ නව නැම්ම ? ඒ විවෘත ආර්ථිකයයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ වර්තමාන ජාතික ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමා එවකට වෙළඳ හා තාවික ඇමතිතුමා වශයෙන් සිටිද්දී " සිංගප්පූරුවේ හදන කුඩ අපේ කුඩවලට වඩා හොඳයි, එම නිසා ඒ කුඩ ලංකාවට ගෙන එන්නට ඉඩ දෙන්න ඕනෑ. ඒවාත් එක්ක තරග කරන්නට අපේ කර්මාන්තකරුවන් ඉගෙන ගන්න ඕනෑ " කියා කී බව මට මතකයි. මේක පුදුම කතාවක්. මම ඒ දවස්වල මේ පාර්ලිමේන්තුවේ සිටියේ නැහැ. නමුත් මේ කතාව අහන කොට මට පුදුමත් හිතුණා. මන්ද ? එහෙම නම් ඇමරිකන්කාරයෝ කියන්නෙ නැත්තෙ, " ඇමරිකාවේ නිෂ්පාදනය කරන රෙදිපිළි ආදියේ මිළ වැඩියි. එම නිසා ක්වෝටා නැතුව ලංකාවෙන් ගෙන්වා ගනිමු. ඕනෑ බඩුවක් රටට එන්නට ඉඩ දෙමු " කියා. යුරෝපා ආර්ථික ගවුලත් ඒ විධියට කියන්නට ඕනෑ. ඇත්තවශයෙන්ම එහෙම නොවෙයි. ඇමරිකාව වාගේ බොහොම දියුණු රටවල් පවා තමන්ගේ රටේ කර්මාන්ත ආරක්ෂා කර ගැනීම පිණිස තීරුබදු පනවා තිබෙනවා. අපේ කර්මාන්ත ඇමතිතුමාත් මේ කාරණය බොහොම හොඳට කියා තිබුණා. මගේ කතගාටුව එතුමාට මොළය පැදුනේ [බාධා කිරීමක්] ගිය සුමානෙ නොවෙයි, මේ අවුරුද්දේදී විමයි.

සිරිල් මැතිව් මහතා (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)
(திரு. சிறில் மத்திவ் — கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(Mr. Cyril Mathew-Minister of Industries & Scientific Affairs)

මම මුල ඉඳලම කිව්වා. කත් වහගෙන හිටියට ඒක මගේ වරදක් නොවෙයි.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

තමුන්නාන්සෙ කිව්වෙ නැහැ. සමහර විට කියන්න ඇති රහසෙ. කලින් නම් කිව්වෙ නැහැ.

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலை)
(Mr. Ananda Dassanayake-Kotmale)

මේ පළමුවන වතාව.

සිරිල් මැතිව් මහතා
(திரு. சிறில் மத்திவ்)
(Mr. Cyril Mathew)

කියන්න ඕනෑ තැන්වලට මම කියල තිබෙනවා. මන්ත්‍රීතුමා දන්නෙ නැති ඒක මගේ වරදක් නොවෙයි.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ලංකාවේ ආර්ථිකයේ නව නැම්මක් ඇති කර විදේශවලින් එන ආණ්ඩුවලට තීරු බදු අය කිරීම් නැති කරන විට ඇමතිතුමා ඒ විධියට කියන්නට ඇති. ඒක මම පිළිගන්නවා. නමුත් එතුමාගේ කටහඬ තුට්ටුවකටවත් ගණන් ගෙන නැහැ. ඒකයි සිදු වුණේ. ඒකෙන් මේ රටේ කර්මාන්ත නැති වී ගියා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පේෂ කර්මාන්තයට සිදු වුණේ මොකක්ද ? හැම කොට්ඨාශයකම අඩු ගණනේ පේෂ කර්මාන්ත ශාලා 20 ක්, 25 ක් තිබුණා. ඒවා ඔක්කොම වසා දමන්නට සිදු වුණා. ඔන්න දන් තමයි ඒවා විවෘත කර ගෙන යන්නේ. දන් බලන්න විවෘත ආර්ථිකය නිසා සිදු වී ඇති දෙයක නැටි. ඉස්සර වෙලාම කිව්වා, ලංකාවේ විවෘත ආර්ථිකයක් පවත්වා ගෙන යන්නට ඕනෑය කියා. එතිසා සීමා දැම්මේ නැහැ. අඩු ගණනේ සීමාවල් ඇති කළා නම් අපට එය පිළිගන්න තිබුණා. අපේ කලින් තිබුණු ආණ්ඩුව ගෙන ගිය ප්‍රතිපත්තිය—සම්පූර්ණයෙන්ම වැයූ ආර්ථික ප්‍රතිපත්තියක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පවත්වා ගෙන යාම—හරි තැති බව මම නම් පිළිගන්නවා. මේ රජයෙන් පාධම් අපිත් ඉගෙන ගෙන තිබෙනවා. නමුත් අපි ඒවා ඉගෙන ගත්තේ තිවැරදි ආකාරයෙන්. මේ රජය සීමාවක් නැතුව විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් ගෙන යාම නිසා ලංකාවේ කර්මාන්තවලින් වැඩි හරියක් නැති වී ගියා.

දැන් අපිට පෙනෙනවා තවත් තව නැම්මක්. මොකක්ද ඒ ? සීමාවන් දලා මේ විවෘත ආර්ථිකය ගෙනයන්නට ඔනෑය කියලා දැන් කියනවා. එතැනදී අපි එකඟ වෙනවා. අපේ කණගාටුව මේකයි. මේ සීමාවන් දමන්න තමුන්නාන්සේලා කල්පනා කළේ, බහු ජාතික සමාගම් ලංකාවට ඇතුල්වෙලා " ආරක්ෂාවක් නැතිව මේ කර්මාන්ත ගෙනයන්නට බැහැ " කියලා කිව්වාට පස්සෙයි.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කීවාක් මෙත් අපේ කර්මාන්ත ඕනෑ තරම් තිබුණා. විශේෂයෙන් මම මේ කාරණය කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාට කිව යුතුයි. එතුමා දන්නවා මේ කර්මාන්තවලට පහර පිට පහර වැදුණු බව. ඒවාට ආරක්ෂාවක් දුන්නේ නැහැ. ඒවා වහන්නට සිද්ධ වුණා. බොහොම අමාරුවෙන් මේ කර්මාන්ත ගෙන ගියේ. තිබුණු සුළු සුළු කර්මාන්ත වැසී ගියා. දැන් තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය වෙනස් වෙනවා නම්, මේ කර්මාන්තවලට ආරක්ෂාව දෙනවා නම්, කර්මාන්ත ඇති කරන්නට පුළුවන් වෙනවා. සිංගප්පූරුව වැනි රටවල කර්මාන්ත ගෙන ගියේ ඒ ප්‍රතිපත්තිය උඩ නොවන බව මම පිළිගන්නවා. තමුන්නාන්සේලා බලයට එන අවස්ථාවේදී කිව්වා, " අපි සිංගප්පූරුව වාගේ යන්නට ඔනෑය " කියලා. සිංගප්පූරුවේ තාලය මෙහි ගෙනයන්නට බැහැ. අපේ රට සුළු නගරයක් නොවෙයි. සතරැස් සැතැප්ම තිහකට සීමාවුණු රටක් නොවෙයි. එමනිසා මේ රටේ කෘෂි කර්මාන්තය ආරක්ෂා කරන්නට අපිට සිද්ධ වෙනවා. සුළු කර්මාන්ත තිබෙනවා. ඒවා ආරක්ෂා කළ යුතුයි.

ප්‍රංශයේ මේ ළඟදී සිද්ධියක් ඇති වුණා. මම හිතන විධියට කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාත් ඒ ගැන කථා කළා. ජපානයෙන් ටේප් රෙකෝඩර්ස්, වීඩියෝ රෙකෝඩර්ස් එනකොට ප්‍රංශ ආණ්ඩුව කිව්වා, ඒවා පරීක්ෂා කර යවන්න ඔනෑය කියලා. එයින් පස්සෙ ' ටේප් රෙකෝඩර්ස් ' ගොඩ ගැහුණා. ඒවා විකුණාන්න බැරි වුණා. අවසානයේදී ප්‍රංශයත් සමඟ එක්කාසුවෙලා ටේප් රෙකෝඩර්ස් සෑදීමට ජපනුන්ට සිද්ධ වුණා. මෙයින් තමුන්නාන්සේලාට පෙනේවි දියුණු රටවල්වත් තමුන්නාන්සේලා ආරම්භ කළ ප්‍රතිපත්ති අද ගෙන යන්නේ නැති බව. කිසිම රටක ගෙනයන්නේ නැහැ. හැම රටකම ආරක්ෂාව තිබෙනවා.

වානේ කර්මාන්තය අද ලෝකයේ තිබෙනවා. නවීන ලෝකයේ වානේ කර්මාන්තය තියම විධියට ආරම්භ වුණේ පළමුවෙන්ම එංගලන්තය, ජර්මනිය, ප්‍රංශය, ඉතාලිය වැනි රටවලයි. ඊට පසුව ඇමෙරිකාව, රුසියාව යනාදී රටවල ආරම්භ වුණා. නමුත්, අද කොරියාව, බ්‍රසීලය වැනි රටවලත්, වානේ කර්මාන්තය අද දියුණුවෙලා තිබෙනවා. [බාධා කිරීම්] ඉන්දියාව අභ්‍යන්තර ' මාර්කට් ' එකෙන් ඒවා කරගෙන යන්නේ.

සිරිල් මැතිව් මහතා
(திரு. சிறில் மத்திவ்)
(Mr. Cyril Mathew)
සවුත් ඇෆ්‍රිකා.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

දකුණු අප්‍රිකාව වැනි රටවල අද වානේ කර්මාන්තය අළුතෙන් ඇති වේගෙන යනවා. ලෝකයේ තරගකාරී තත්ත්වය උඩ අද එංගලන්තයේ සමහර කර්මාන්ත වහන්න සිද්ධ වෙලා තිබෙනවා. ප්‍රංශයේ සමහර කර්මාන්ත වහන්නට සිද්ධ වෙලා තිබෙනවා. ජර්මනියේ සමහර කර්මාන්ත වහන්නට සිද්ධ වෙලා තිබෙනවා. දැන් ඒ රටවල් කුමක්ද කියන්නේ ? ඇමෙරිකාවත් දැන් කියනවා ඒ කර්මාන්තවලට ආරක්ෂාව දෙන්නට ඔනෑය කියලා.

තියෝජ්‍ය කාරකසභාපතිතුමනි, අද ඇමෙරිකාව හදන සමහර වානේ වර්ගවලට ආරක්ෂාව දීලා තිබෙනවා. යුරෝපයෙන් එන වානේ සමඟ තරග කරන්නට බැරි නිසා ඇමෙරිකාවෙත් තීරුබදු දමා තිබෙනවා. අපි පමණයි විවෘත ආර්ථිකය ගැන කථා කරන්නේ. ලෝකයෙන්ම දියුණු ධනපති රටක් වන ඇමෙරිකාව ඒ රටේ රෙදි කර්මාන්තයට, වානේ කර්මාන්තයට ඉලෙක්ට්‍රොනික් කර්මාන්තයට හොඳට ආරක්ෂාව දීලා තිබෙනවා. කාර් කර්මාන්තයටත් ආරක්ෂාව දීලා තිබෙනවා.

දැන් තමුන්නාන්සේලා මධ්‍යස්ථ ප්‍රතිපත්තියට ළඟා වේගෙන එනවා. ඒ ගැන අපි සන්තෝෂයි. දැන් සීමාවන් නැති විවෘත ආර්ථිකය නොවෙයි. දැන් තමුන්නාන්සේලා සීමාවන් දමාගෙන යනවා. නමුත්, තමුන්නාන්සේලා බහු ජාතික සමාගම් බලයට පත් කළාට පස්සෙයි එතැනට ඇවිත් තිබෙන්නේ. ඒ ගැන අපි කණගාටු වෙනවා.

අපේ සමහර කර්මාන්ත ගෙන යෑමට අපට තාක්ෂණ ඥානය නොතිබුණු බව මම ඇත්ත වශයෙන්ම පිළිගන්නවා. සමහර විට ඒවායේ පරිපාලනය ගෙන යෑමේදී අමාරුකම් ඇති වුණා. ඒ අමාරුකම පිළිබඳ වගකීමේ කොටසක් කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා භාර ගන්නට ඔනෑ. මොකද ? ඒවායේ පරිපාලනය ගෙන යෑමට බැරි තත්ත්වයක් අද ඇති කර තිබෙන්නේ ජාතික සේවක සංගමය නිසා. ජාතික සේවක සංගමයේ උදවිය මේ ස්ථානවල හොරකම් කිරීමට මුල් වී සිටින නිසා වේරහැර වැනි වැඩ පොළවල් අද බඩු නොග පිටින් ගෙන යනවා. මම මෙය ඉතාම කනගාටුවෙන් තමුන්නාන්සේට කියනවා. මම මෙය තීර්හයව ප්‍රකාශ කරනවා.

සිරිල් මැතිව් මහතා
(திரு. சிறில் மத்திவ்)
(Mr. Cyril Mathew)
සම්පූර්ණ බොරුවක්. ශ්‍රී ලංකාකාරයො තමයි ඔය හොරකම් ඔක්කොම කරන්නේ.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)
මම ඉල්ලීමක් කරනවා. තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවේ කාරක සභාවක් පත් කරන්න. ඒ ගැන සොයා බලන්න. ජාතික සේවක සංගමය ගැන පමණක් නොවෙයි, ඕනෑම යුනියන් එකක් ගැන පරීක්ෂා කරන්න. [බාධාකිරීම්] මේ ළඟදී ඒකල වැඩ පොළෙන් ඇළුම්නියම් ටොන් දෙකක් එළියට ගෙන ගියා. මේවා කරන්නේ එහි ආරක්ෂක අංශයේ උදවිය බව මම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ.

සිරිල් මැතිව් මහතා
(திரு. சிறில் மத்திவ்)
(Mr. Cyril Mathew)
ආරක්ෂක අංශයේ සෑම පක්ෂයෙන්ම සිටිනවා, සෑම වෘත්තීය සමිතියෙන්ම සිටිනවා. ඔක්කොම හොරකම් කරන්නේ ශ්‍රී ලංකාකාරයෝ. ඒක තතර කරන්න බැරුව තමයි දැන් ගමනාගමන මණ්ඩලයේ පාඩු වෙන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
සභාපතිතුමා ඉල්ලා අස්වෙන්න ඕනෑ.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)
වෙනත් වෘත්තීය සමිති නැහැ. ශ්‍රී ලංකා කාරයො හරි, සමසමාජ කාරයො හරි, කවුරු හරි වැරදි කරනවා නම් ඒ අයට අඩුවම් කරන්න. ඒවා ගැන විභාග කර දඬුවම් කරන්න. තමුන්නාන්සේලා පරීක්ෂා කර බලන්න, ජාතික සේවක සංගමයේ කීදෙනෙක් අලුතෙන් ගෙවල් හද තිබෙනවද කියා. මම අද මේ සභාවේ ප්‍රසිද්ධියේම කියනවා. මේ ගැන කොමිසමක් පත් කරන්න. බලන්න කී දෙනෙක් අලුතෙන් ගෙවල් හද තිබෙනවාද කියා.

සිරිල් මැතිව් මහතා
(திரு. சிறில் மத்திவ்)
(Mr. Cyril Mathew)
අලුතෙන් ගෙවල් ලංකාවේ හැම තැනම හද තිබෙනවා. මෙයා දැකල තියෙන්නේ ඔය ගෙවල් ටික විතරයි. රටේ ඕනෑම තැනක යන්න. අලුතෙන් ගෙවල්, ගොඩනැගිලි හැම තැනම හද තිබෙනවා. බෝක්කු පාළම් හැම එකම හද තිබෙනවා. තමුන්නාන්සේලාගෙ කාලයේ වාගේ නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

මම මේ කරුණු කියන්නෙ අවංකව. ඒවා වහගෙන ගෙනයන්න තමුන්නාන්සෙලට ඕනෑ නම් අපේ විරුද්ධත්වයක් නැහැ. කවද හෝ ඒවා එළිදරව් වෙයි. මම කියන්නේ හොඳට. තමුන්නාන්සේලා අප සමඟ එකතු වී කරුණාකර මේ ගැන පරීක්ෂණයක් කර බලන්න. මේවා සිදු වෙනවද නැද්ද. පාලනයට ඇඟිලි ගැසීම් තිබෙනවාද, හොරකම් කිරීම් තිබෙනවාද කියා පරීක්ෂා කර බලන්න. අපේ කාලයේදී අපේ මිනිසුන් හොරකම් කළේ නැහැයි මම කියන්නෙ නැහැ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உப தலைவர்)
(The Deputy Chairman of Committees)

Order please ! තමුන්නාන්සේ මූලාසනයට කතා කරන්න.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

සමා වෙන්න ගරු සභාපතිතුමනි. අපේ කාලයේ හිටියේ ඔක්කොම පසේ බුදුවරුය, හොරකම් කළේ නැත කියා මම කියන්නෙ නැහැ. නමුත් එද හොරකම් කළ අයට දඬුවම් කිරීමට අපට ශක්තියක් තිබුණා. මම ලංකා ගමනාගමන මණ්ඩලයේ සිටින විට මා සිටියේ සමසමාජ පක්ෂයේ. එද වැඩිපුරම වැඩ තහනම් කරන ලද්දේ සමසමාජ පක්ෂයේ උදවියගෙයි. තමුන්නාන්සෙත් දන්නවා ඒක.

සිරිල් මැතිව් මහතා
(திரு. சிறில் மத்திவ்)
(Mr. Cyril Mathew)

තමුන්නාන්සේට මතකද එද මම ඇවින් ලංගමයේ සභාපති වශයෙන් තමුන්නාන්සේ හමු වුණා.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ඔව්.

සිරිල් මැතිව් මහතා
(திரு. சிறில் மத்திவ்)
(Mr. Cyril Mathew)

මම එද ආවේ මාරුවීමක් ගැන කතා කරන්න.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

ඔව්.

සිරිල් මැතිව් මහතා
(திரு. சிறில் மத்திவ்)
(Mr. Cyril Mathew)

තමුන්නාන්සේ මට එද කිව්වේ මොකක්ද ? "මම මෙතැන ඉන්නෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිසා." තමුන්නාන්සෙයි මේ කියන්නෙ. "ඕනෑම මන්ත්‍රීවරයෙක් කිව්වොත් මම ඕනෑම එකෙක් මාරු කරනවා" කියා තමුන්නාන්සෙ කිව්වා.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

නැහැ, මම එහෙම කිව්වෙ නැහැ.

සිරිල් මැතිව් මහතා
(திரு. சிறில் மத்திவ்)
(Mr. Cyril Mathew)

මටයි කිව්වෙ.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உப தலைவர்)
(The Deputy Chairman of Committees)

I think it is better to speak on the Customs Reslotion. You are going out of the track. This has no bearing on the subject.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

මම කියන්නම් අවංකව මොකක්ද වුණේ කියා. [බාධා කිරීම්] මට තව මිනිත්තු දෙකක් දෙන්න. මම අවසාන කරනවා. මම කියන්න හදන්නේ මෙයයි. අපි කතා කර තමුන්නාන්සේලාට මේ කරුණු කියන්නේ ලංකාවේ කර්මාන්ත දියුණු කිරීමේ අදහසින්. ලංකාවේ කර්මාන්ත දියුණු කිරීමට ඒවා සඳහා යම් කිසි ආරක්ෂාවක් ඕනෑ. අද ගරු කර්මාන්ත ඇමතිතුමා එක හඬින් කියන්නේ එයයි. මේ තත්ත්වය දියුණු කර ඉදිරියට ගෙන යන ලෙසයි අප ඉල්ලා සිටින්නේ.

හරින්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

නැගී සිටියේය—
எழுந்தார்.
rose.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உப தலைவர்)
(The Deputy Chairman of Committees)

It is now time to move the Adjournment.

හරින්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

Can I continue the Debate tomorrow ?

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உப தலைவர்)
(The Deputy Chairman of Committees)

I have recognized you. You can continue

එකල්හි වේලාව ආ හා. 7 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී. එතැන් සිට විවාදය 1984 අගෝස්තු 8 වන බදාදා පවත්වනු ලැබේ.

அப்போது மி. ப. 7 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது. 1984 ஓகஸ்ட் 8, புதன்கிழமை விவாதம் மீள ஆரம்பமாகும.

It being 7 p.m., Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Wednesday, 8th August, 1984.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)

(Mr. M. Vincent Perera -Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I move.

"That the Parliament do now adjourn."

ප්‍රශ්නය සාකච්ඡා කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)
(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)
(Mr. Sarath Muttetuwegama–Kalawana)

ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, ආහාර හා කෘෂිකර්ම ඇමතිතුමාගෙන් ඇසීමට මම ප්‍රශ්නයක් කල් දී තිබෙනවා. මෑතදී එතුම් පසුගිය මාසය තුළ රජයේ ප්‍රකාශකයින්ගෙන් උපුටාගත් ප්‍රකාශයන් කීපයක් ප්‍රවෘත්ති පත්‍ර කීපයක පළ වුණා. මේ රටේ දැනට පවතින ආහාර මුද්දර ක්‍රමය එක්කො අවලංගු කරන්න. එසේ නැත්නම් ඒ ආහාර මුද්දර ක්‍රමයේ සැලෙන සංශෝධනයක් කරන්න රජය ඉදිරි කාලයේදී බලාපොරොත්තු වෙනවාය කියන අදහසයි එහි තිබුණේ. මම දැනගන්න සතුටුයි ආහාර මුද්දර ක්‍රමය පිළිබඳව රජය දැනට අනුගමනය කරන ප්‍රතිපත්තියත් ඉදිරියට අනුගමනය කරන්න බලාපොරොත්තු වන ප්‍රතිපත්තියත් මොකක්ද කියා. විශේෂයෙන්ම දැනට යම්කිසි පර්යේෂණයක් කරගෙන යනවාය කියලා එක වාර්තාවක තිබුණා. ඒ මොකද, ආහාර මුද්දර දැනට හුක්ති විඳින්නන් රාශියක් — විශාල සංඛ්‍යාවක් — ඒවාට හිමිකම් නැති උදවියයි කියා තිබුණා. මේක පුදුම ප්‍රකාශයක්. ඒකෙ අනික් පැත්තයි ඇත්ත. ආහාර මුද්දර ලැබිය යුතු උදවිය විශාල සංඛ්‍යාවක් ආහාර මුද්දර ලබාගෙන නැහැ, මේ රජයේ තක්සේරුව යටතේ. ඒ නිසා මේ අපරාධය කරන්න ආණ්ඩුව බලාපොරොත්තු වෙනවාද.

තියෝජ්‍ය කථානායකතුමනි, ආහාර මුද්දරය තමයි මේ රටේ රු. 300 කට අඩු ආදායමක් ලබන ඉතාම දුප්පත් කොටසේ මුළු පවුලටම ලැබී තිබෙන එකම සහනය. එදිනෙද ජීවත් වීමට වුවමනා කරන යම් යම් භාණ්ඩ මුදලට ගැනීමට — අවශ්‍ය රු. 15 ක රු. 16 ක බඩු ගැනීමට — තිබෙන එකම පිහිටයි. ඒක නැති කර, ඒ ඉතාමත් දුප්පත් කොටසගේ බඩට ගහන්නට මේ ආණ්ඩුව සූදානම් වෙනවාද නැද්ද කියන එක ගැන ඇමතිතුමා නැත්නම් වෙන කවුරු හෝ ආණ්ඩුව වෙනුවෙන් මේ සභාවේදී ප්‍රකාශයක් කරන හැටියට මම ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ආ හා 7.02

ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — அத்தனகல்ல)
(Mr. Lakshman Jayakody–Attanagalla)

ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්න දෙකක් පමණක් අහන්නයි මම නැගී සිටියේ. ඉඩම්, ඉඩම් සංවර්ධන හා මහවැලි සංවර්ධන ඇමතිතුමාගෙන් ඒවා ඇසීමට මම කල් දී තිබුණා. මම ඉතාමත්ම කෙටියෙනුයි ඒවා අහන්නෙ.

1984 මාර්තු මාසයේ සිට රජය විසින් ගෙවනු ලබන ජීවනාධාර මුදල වන රු. 102 ගංගා නිර්මිත සංවර්ධන මණ්ඩලයේ සේවකයින්ට තොලැබෙන බව එතුමා දන්නවාද ? එම මුදල ගෙවීම ක්‍රියාත්මක වූ දිනයේ සිට හීන මුදලත් ඉන් පසු මාසිකව රු. 102 බැගිනුත් එම සේවකයින්ට ගෙවීමට එතුමා කටයුතු කරනවාද ? එසේ නොවේ නම් ඒ මන්ද ? මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස කථා කරන්න වුවමනා නැහැ කියලයි මගේ හැඟීම. මෙය බොහෝම පැහැදිලි කාරණයක්. මේ රජයේ මුදල් ප්‍රතිපත්තිය අනුව ඇමතිතුමා විසින් දෙන ලද මේ සහනය මේ ශ්‍රේණිවල සේවකයින්ට ලැබෙන්නෙ නැහැ. එම නිසා එම දීමනාව ඒ උදවියටත්, විශේෂයෙන්ම සංවර්ධන මණ්ඩලයක සේවය කරන පිරිසක් නිසා ඒ සේවකයන්ටත් ලබා දීමට කටයුතු කිරීම අපේ යුතුකමක්. එම යුතුකම ඉටු කරන මෙත් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ හා කාර්මික ආයතනයේ සේවක සංගමයේ සභාපති මහත්වරුන් හා එම නිලධාරී මහත්වරුන් වෙනුවෙන් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි.

දෙවැනි ප්‍රශ්නය අසන්නට බලාපොරොත්තු වන්නේ කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා සහ ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගෙනුයි. එතුමා මේ ස්ථානයේ මේ වෙලාවේ නැතත් එතුමාගේ තියෝජ්‍ය ඇමතිතුමා මෙහි සිටිනවා. ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ ගල්ඔය කර්මාන්තායතනයේ සේවය කරන ලිපිකරු කේ. කේ. පියසේන මහතා 1984. 08. 01 වන දින සිට කන්තලේ කර්මාන්තායතනයටත්, පරිපාලක ඩබ්ලිව්. එම්. සෙනෙවිරත්න මහතා සහ රියැදුරු කේ. පී. සිම්යොන් චන්ද්‍රපාල මහතා සෙවනගල සීනි ව්‍යාපෘතියටත් මාරු කර ඇති බව දන්නවාද ? කේ. කේ. පියසේන මහතා සහ ඩබ්ලිව්. එම්. සෙනෙවිරත්න මහතා ශ්‍රී ලංකා සර්ව කාර්මික කම්කරු සමිතියේ තියෝජිත මහත්වරුන් වශයෙන් ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය පිළිගෙන තිබෙනවා. ඒ ක්‍රියත්තේ, කන්තලේ ශාඛාව ඔවුන් තියෝජිතයන් හැටියට පිළිගෙන තිබෙනවා.

මෙම දෙදෙනා මාරු කිරීමෙන් එහි වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වයට බාධා පැමිණෙන බැවින් එම දෙදෙනා ඇතුළු මාරු කර ඇති සියලුම දෙනාගේ මාරුවීම් අවලංගු කරනවාද ? එසේ නොවේ නම් ඒ මන්ද ?

මෙතැන සිදුවී තිබෙන්නේ මෙයයි. වෘත්තීය සමිතියක් විසින් තම තියෝජිත මහත්වරුන් තෝරා ගන්නවා. එම තියෝජිත මහත්වරුන් තෝරා ගන්නාට පසුව ව්‍යාපාරයේ අයිතිකරුවන් සාකච්ඡා ආදිය පවත්වන්නේ එම තියෝජිත මහත්වරුන් සමගයි. එම තියෝජිත මහත්වරුන් සේවකයන් විසිනුත් පිළිගන්නවා. අයිතිකරුවන් විසිනුත් පිළිගන්නවා. අයිතිකරුවන් වශයෙන් මෙහි සඳහන් වන්නෙ සීනි සංයුක්ත මණ්ඩලයයි. සංයුක්ත මණ්ඩලය විසින් පිළිගෙන තිබෙන මේ තියෝජිතයන් දෙදෙනා සිරිතක් වශයෙන් වෙනත් ස්ථානයකට මාරු කර යවන්නෙ නැහැ. එය කවුරුන් පිළිගන්නා ප්‍රතිපත්තියක්. වෘත්තීය සමිති තියෝජිතයන්ය කියා පිළිගන්නාට පසුව මාරු කර යවන්නෙ නැහැ. නමුත් මේ සීනි සංයුක්ත මණ්ඩලය ඒ පිළිගත් ප්‍රතිපත්තිය කඩා දමමින් කම්කරු විරෝධී වැඩක් කර තිබෙනවා. එවැනි දෙයක් කළා නම් එය ඉතාමත් පහත් වැඩක් හැටියට මා සලකනවා. ඒ නිසා එවැනි කටයුත්තක් නොකරන ලෙස ඉල්ලා සිටීමටයි මේ ප්‍රශ්නය ඇසීමෙන් මා බලාපොරොත්තු වුණේ. ගරු ඇමතිතුමාගේ මැදිහත්වීමෙන් එම මාරුවීම් තවත්වන ලෙස මා ඉල්ලා සිටිනවා.

තියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உப தலைவர்)
(The Deputy Chairman of Committees)

Minister of Agricultural Development and Research and Minister of Food and Co-operatives.

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා (තියෝජ්‍ය ආහාර හා සමුපකාර ඇමතිතුමා)
(திரு. சரத்சந்திர ராஜகருணா — உணவு, கூட்டுறவுப் பிரதி அமைச்சர்)
(Mr. Sarathchandra Rajakaruna–Deputy Minister of Food & Co-operatives)

නැත. පැතනොතගී.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

උත්තරය ඒකද ?

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந்திர ராஜகருணா)
(Mr. Sarathchandra Rajakaruna)

ඔව්. තමුන්නාන්සේගේ ප්‍රශ්නයට පිළිතුරු තමයි ඒ.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

මෙක විහිලුවක් නේ ! කල් තැබීමේ අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නවලට මේ විධියට පිළිතුරු දී ගැලවී යන්නට හදනවා මා පාර්ලිමේන්තුවේ සිටි කාලය තුළදී මෙතෙක් දැක නැහැ. මම ඇසුවේ වර්තමාන තත්ත්වය මොකක්ද කියලයි. ඒ ගැන යම්කිසි පරීක්ෂණයක් කරගෙන යනවාද ? එම වාර්තාවේ සත්‍යයක් තිබෙනවාද ? තමුන්නාන්සේ දුන්න පිළිතුර මොකක්ද ? " නැත. පැතනොතගී. " පැතනොතගින්නේ මොකක්ද ?

සරත්චන්ද්‍ර රාජකරුණා මහතා
(திரு. சரத்சந්திர ராஜகருணா)
(Mr. Sarathchandra Rajakaruna)

ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, කලවාන ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය නම් දැනට පවත්වාගෙන යන ආහාර මුද්දර ක්‍රමය ඉවත් කිරීමට හෝ ප්‍රතිසංවිධානය කිරීමට අදහස් කරනු ලබන්නේද යන්නයි. එයට පිළිතුර " නැත. පැතනොතගී. " යන්නයි.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

මම වාචිකව ඇසූ ප්‍රශ්නයට උත්තර නැහැ නේ. හොඳයි අපි බලමු. තමුන්නාන්සේ අද නැතැයි කිව්ව දේ කෙරෙන්නෙ නැද්ද කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. හා. 7. 08

ගාමිණී දිසානායක මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා සහ මහවැලි සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා)

(திரு. காமினீ திஸாநாயக்க — காணி, காணி அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி அமைச்சரும்)

(Mr. Gamini Dissanayake–Minister of Lands & Land Development and Minister of Mahaweli Development)

අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ගංගා තිමින සංවර්ධන මණ්ඩලය ගැන ඇසූ ප්‍රශ්නයටයි මේ පිළිතුර. එහි දිමනා දීම සම්බන්ධව කල් දැමීමක් කර තිබෙන බව මම පිළිගන්නව. ගංගා තිමින සංවර්ධන මණ්ඩලය ආණ්ඩුවෙන් මුදල් නොලබන, තමාගේ කොන්ත්‍රාත්තුවලින් ලැබෙන ආදායමෙන් පාලනය ක්‍රියාත්මක කරන්නාවූ සංස්ථාවක්. දැනට අවුරුදු ගණනකට පෙර ඒ සේවකයන්ගේ පඩි සම්බන්ධයෙන් යම්කිසි දීමනාවක් දුන්නා. ඒ හැර එහි තවත්තුව හා පාලනය සම්බන්ධව වෙනත් කිසිම දීමනාවක් ලැබෙන්නේ නැහැ. නමුත් පසුගිය මාස තුන-හතරක කාල සීමාව තුළදී රටේ පැවතුන දේශගුණය නිසා විශේෂයෙන්ම වර්ෂාව නිසා ගංගා තිමින සංවර්ධන මණ්ඩලයට සිද්ධ වුණා, එහි සේවකයින්ගෙන් වැඩ නොගෙන පඩි ගෙවන්න. එම දීමනා කලට වේලාවට ගෙවන්නට ගංගා තිමින සංවර්ධන මණ්ඩලය බලාපොරොත්තු වෙනවාය කියා මා ගරු මන්ත්‍රීතුමාට ප්‍රකාශ කරනවා.

අ. හා. 7. 10

එස්. එස්. අබේසුන්දර මහතා (නියෝජ්‍ය කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා)

(திரு. எஸ். எஸ். அபேசுந்தர — விவசாய அபிவிருத்தி, ஆராய்ச்சிப் பிரதி அமைச்சர்)

Mr. S. S. Abeysundera–Deputy Minister of Agricultural Development & Research)

To question No. 1, "Is he aware that Mr K. K. Piyasena, clerk is serving at the Gal-Oya Sugar Factory of the Sri Lanka Sugar Corporation ?" the answer is " yes. " To the second question, "Is he aware that Mr. K. K. Piyasena and Mr. W. M. Senaviratne have been accepted by the Sri Lanka Sugar Corporation as representatives of the Sri Lanka Technical Labour Society ?" the answer is " yes." To question No. 2 (ii), "Will he take action to cancel the transfers of all including these two employees since these transfers will affect the trade union activities ?" the answer is, "There is another–

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Sir, these are not the questions that I have asked. I can table the questions that I have asked. I do not know from where the hon. Deputy Minister got these questions because the questions that I have asked were in Sinhala.

26. 7. 84

ගරු කථානායකතුමා,
පාර්ලිමේන්තුව,
කෝට්ටේ.

ගරු කථානායකතුමනි,

පහත සඳහන් ප්‍රශ්නය 1984 අගෝස්තු මස 07 දින සභාව කල් තබන අවස්ථාවේදී ගරු ආහාර සහ කෘෂිකර්ම ඇමතිතුමාගෙන් ඇසීමට මම බලාපොරොත්තු වෙමි."

ඒ පිළිවෙළට මම සිංහලෙන් ප්‍රශ්නය ලියා එවා තිබෙනවා. නමුත් මෙතුමා කියන විධියෙ ප්‍රශ්නයක් මම ඇහුවේ නැහැ. කොහෙන්ද ඔය ප්‍රශ්නය ඇහුවේ ? කවුද ඔක ලියල දුන්නේ ? වෙනත් අයෙක් ලියල දුන්න ප්‍රශ්නයකට එතුමා දුන් උත්තර දෙනවා.

Sir, let him have time. I will give him time till tomorrow to give me a concrete reply.

එස්. එස්. අබේසුන්දර මහතා
(திரு. எஸ். எஸ். அபேசுந்தர)
(Mr. S. S. Abeysundera)

But, this is the question that you have asked. About whom did you question now ? It is not in English. You may have asked in Sinhala but I am entitled to answer in English, Sinhala or Tamil.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

But, how do you know that the question that I have asked is in English ? Have you got a translation ?

එස්. එස්. අබේසුන්දර මහතා
(திரு. எஸ். எஸ். அபேசுந்தர)
(Mr. S. S. Abeysundera)

It has been translated.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Oh, I see ! You have translated ? I understand now.

එස්. එස්. අබේසුන්දර මහතා
(திரு. எஸ். எஸ். அபேசுந்தர)
(Mr. S. S. Abeysundera)

It has been translated into English.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

But, that is not the question that I asked.

එස්. එස්. අබේසුන්දර මහතා
(திரு. எஸ். எஸ். அபேசுந்தர)
(Mr. S. S. Abeysundera)

Why not ? That is the question you asked. Had Mr. K. K. Piyasena, clerk, serving at the Gal-Oya Sugar Factory of the Sri Lanka Sugar Corporation been transferred to the Kantale Factory and Mr. W. M. Seneviratne, Supervisor, and Mr. J. T. Simon Chandrapal, driver, transferred to the Sevenegala Sugar Project I from 1.8.84. To that, the answer is yes.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழு உப தலைவர்)
(The Deputy Chairman of Committees)

ඔක ලියල දෙන්නේ නැතිව බැහැ කියවන්න. නම් ටික මතක නැතිව යනවානේ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ට්‍රාන්ස්ලේට් කරල දීල තිබෙන්නේ.

එස්. එස්. අබේසුන්දර මහතා
(திரு. எஸ். எஸ். அபேசுந்தர)
(Mr. S. S. Abeysundera)

තමුන්නාන්සේ ඉංග්‍රීසි දන්නේ නැති බව මම අදයි දන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
ඔව් මම දන්නේ නැහැ. ඒ භාෂාව මට තේරෙන්නේ නැහැ.

එස්. එස්. අබේසුන්දර මහතා
(திரு. எஸ். எஸ். அபேசுந்தர)
(Mr. S. S. Abeysundera)
මේ පාර්ලිමේන්තුවේ ඉංග්‍රීසි භාෂාවෙන් කථා කරන්න පුළුවන් බව තමුන්නාන්සේ දන්නවානේ.

To the second question, "Is he aware tht Mr. K. K. Piyasena and Mr. W. M. Seneviratne have been accepted by the Sri Lanka Sugar Corporation as representatives of the Sri Lanka Technical Labour Society ?" the answer is yes. To question No. 2 (ii), "will he take action to cancel the transfers of all including these two employees since these transfers will affect the trade union activities there ?" the answer is, "Ther is another representative in this factory to anttend to trade union work. Therefore, there is no need to cancel these transfers.". The answers to the other questions do not arise in view of the above answers.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
Sir, I am not satisfied with that answer. But, anyway, I will ask him –

එස්. එස්. අබේසුන්දර මහතා
(திரு. எஸ். எஸ். அபேசுந்தர)
(Mr. S. S. Abeysundera)
You ask me any other questions and I will answer them.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
The point is this : it had been decided by the management that these two officers should be there to represent them. Here, one person is transferred, and I cannot understand when the Deputy Minister turns round and tells me that one person is enough. One person is not enough there. You must have two people.

එස්. එස්. අබේසුන්දර මහතා
(திரு. எஸ். எஸ். அபேசுந்தர)
(Mr. S. S. Abeysundera)
I will answer that question also. "It is the Government policy not to transfer key officers of the present organization without the approval of the Hon. Minister. (Establishment Code 21 Section 4, copy attached) In this case the employees transferred from Gal-Oya Factory are not key officers or office-bearers of the parent union but representatives. There is one representative already in this body. There are about 400 surplus employees in the Hingurana factory. They are transferred to the different factories according to the exigencies of service. About 35 employees have already been transferred from the Hingurana factory to the various other establishments. These transfers were effected in order to balance the excess employees."

ප්‍රශ්නය විමසන ලදින්, සහයම්මත විය.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඒට අනුකූලව අ. භා. 7.15 ට 1984 අගෝස්තු 8 වන බදාදා පස්වරු 3 වන තෙක් කල් තියේ ය.

அதன்படி, பி. ப. 7,15 மணிக்கு பாராளுமன்றம், 1984 ஓகஸ்ட் 8, புதன்கிழமை பி. ப. 3 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 7.15 p.m. untill 3. p.m. on Wednesday, 8th August, 1984

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

WRITTEN ANSWERS TO QUESTIONS

එන්. එන්. දිනෝරිස් මහතා : විශ්‍රාම ප්‍රතිලාභ

திரு. என். என். தினோரிஸ் : இளைப்பாற்று நன்மைகள்

MR. N. N. DINORIS : RETIREMENT BENEFITS

139/84

ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)
(கலாநிதி டபிள்யு. தஹநாயக்க — காலி)
(Dr. W. Dahanayake Galle)

අග්‍රාමාත්‍ය සහ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා සහ මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) ගාල්ලේ මහ නගර සභාවේ 2 වන ශ්‍රේණියේ මේසන්වරයෙකු (අංක 12667) වශයෙන් අවුරුදු 12 ක් සේවය කොට 1983 ජූලි මාසයේදී විශ්‍රාම ගිය ගාල්ලේ වටරවුම පාරේ කෝවිල වත්තේ නො.31/9 පදිංචි එන්. එන්. දිනෝරිස් මහතාට කිසිම පාරිතෝෂිකයක් හෝ, විශ්‍රාම වැටුපක් හෝ, අර්ථසාධක අරමුදල් ආපසු ගෙවීමක් හෝ, වෙනයම් ගෙවීමක් හෝ ලැබී නොමැති බැව් එතුමා දන්නේද ?

(ආ) ඔහුට හිමිවත්තේ මොන මුදලද ?

(ඇ) ඔහුට ගෙවත්තේ කවදද ?

பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு நிர்மாண அமைச்சரும் பெருவீதிகள் அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) 12 வருடங்கள் காலி மாநகரசபையில் 2 ஆம் தர மேசனாக (இல. 12667) இருந்து 1983 ஜூலையில் இளைப்பாறிய, காலி, சேர்க்குலர் வீதி, கோவில வத்தை, 31/9 ஆம் இலக்கத்தில் வசிக்கும் திரு. என். என். தினோரிஸ் என்பவர், பணிக்கொடையோ, ஓய்வூதியமோ, சேமலாப நிதி மீளளிப்போ, வேறு கொடுப்பனவுகளோ பெறவில்லை என்பதை அவர் அறிவாரா ?

(ஆ) இவர் எதற்கு உரித்துடையவர் ?

(இ) இவருக்கு எப்போது இவை வழங்கப்படும் ?

asked the Prime Minister and Minister of Local Government Housing and Construction and Minister of Highways :

(*a*) Is he aware that Mr. N. N. Dinoris, of 31/9, Kovilawatta, Circular Road, Galle, who was a grade 2 mason, No. 12667, in the Galle Municipal Council for 12 years, and retired in July, 1983, has not received any gratuiry or pension or refund of provident fund or any other payment yet ?

(*b*) What is he entitled to ?

(*c*) When will he be paid ?

ආර්. ප්‍රේමදස මහතා (අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(திரு. ஆர். பிரேமதாச — பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(Mr. R. Premadasa–Prime Minister, Minister of Local Government, Housing & Construction, Minister of Highways, and Leader of the House of Parliament)

(අ) ඔව්.

(ආ) විශ්‍රාම ලබන අවස්ථාව වන විට දිනෝරිස් මහතාගේ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකි සේවා කාලය අවුරුදු 10 කට අඩු වූ බැවින් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුපක් ලැබීම සඳහා ඔහුට හිමිකමක් නොමැත. එහෙත්, සානුකම්පික හේතුන් මත, මහ නගර සභා ආඥ පනත යටතේ ඔහුට විශ්‍රාම වැටුපක් ගෙවීමට මහ නගර සභාවට පුළුවන.

(ඇ) එකී මහ නගර සභා ආඥ පනත යටතේ ඔහුට ගෙවිය හැකි විශ්‍රාම වැටුප ගෙවීම සඳහා ඉක්මණින් කටයුතු කරන ලෙස ගාලු මහ නගර සභා කොමසාරිස්වරයාගෙන් ඉල්ලා ඇත.

(அ) ஆம்.

(ஆ) திரு. என். என். தினோரிஸ் உள்ளூராட்சி சேவை ஓய்வூதிய அமைப்பு விதிகளின் கீழ் பத்து வருஷ சேவைக்காலம் இல்லாமையினால் அவர் ஓய்வூதியம் பெறத் தகுதியற்றவராவார். ஆனால் மாநகரசபை பச்சாதாப முறையில் மாநகர விதிகளின் கீழ் இவருக்கு ஓய்வூதியம் கொடுக்கலாம்.

(இ) காலி மாநகரசபை, விதிகளின்கீழ் இவருக்குக் கொடுக்கப்படவேண்டிய ஓய்வூதியத்தைச் சீக்கிரம் கொடுக்குமாறு பணிக்கப்பட்டுள்ளது.

(*a*) Yes

(*b*) As Mr. Dinoris had less than 10 years of service that can be counted for pension purposes he is not entitled to a pension under the Local Govt., Service Pension Regulations. But on sympathetic grounds the Municipal Council may pay him a pension under the Municipal Councils Ordinance.

(*c*) The Municipal Commissioner, Galle, has been requested to take early action to pay him the pension that may be paid to him under the said Municipal Councils Ordinance.

පී. එච්. එමලි මහත්මිය : විශ්‍රාම ප්‍රතිලාභ

திருமதி பீ. எச். எமலி : இளைப்பாற்று நன்மைகள்

MRS. P. H. EMALY : TERMINAL BENEFITS

113/84

ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

යෞවන කටයුතු හා රැකීරක්ෂා ඇමතිතුමා සහ අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) ගාල්ලේ, මාගාල්ලේ කච්චුවත්ත පාරේ 28/11 හි පී. එච්. එමලි මහත්මියට කොළඹ, බම්බලපිටියේ මුස්ලිම් කාන්තා විද්‍යාලයේ ශිෂ්‍ය නිවාසයේ 1948 සිට 1978 දක්වා අවුරුදු 30 ක් වැඩ කොට 1978 සැප්තැම්බර් 14 වැනිද අස්වූ විට පාරිතෝෂික දීමනාවක් හෝ විශ්‍රාම වැටුපක් හෝ අර්ථ සාධක අරමුදලක් හෝ නොගෙවන ලද බව එතුමා දන්නේද ?

(ආ) පරීක්ෂණයක් පවත්වා ඇයට සාධාරණ පාරිතෝෂිකයක් සහ ඇගේ අර්ථ සාධක අරමුදල් ගෙවීමට එතුමා කටයුතු කරන්නේද ?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

இளைஞர் அலுவல்கள், தொழில்வாய்ப்பு அமைச்சரும் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) 28/11, கச்சுவத்தை ரோட்டு, மாகால்ல, காலி என்ற முகவரியினராகிய திருமதி பீ. எச். எமலி கொழும்பில் பம்பலப்பிட்டியிலுள்ள முஸ்லிம் மகளிர் கல்லூரி விடுதியில் 1948 முதல் 1978 வரை 30 ஆண்டுகளாகக் கடமையாற்றினாரென்பதையும் ஆயினும், 1978 செப்டம்பர் 14 இல் ஓய்வுபெற்ற சமயம் அவருக்கு பணிக்கொடையோ ஓய்வூதியமோ சகாய நிதியோ கொடுபடவில்லை என்பதையும் அவர் அறிவாரா ?

(ஆ) விசாரணை ஒன்றை ஏற்படுத்தி அவருக்கு நியாயமான ஒரு பணிக்கொடையும் அவரது சகாயநிதியும் கொடுபடச் செய்வாரா ?

(இ) இல்லையேல், ஏன் ?

asked the Minister of Youth Affairs and Employment and Minister of Education :

(*a*) Is he aware that Mrs. P. H. Emaly, of 28/11, Kachchuwatte Road, Magalle, Galle, worked in the Hostal of the Muslim Ladies College, Bambalapitiya, Colombo, from 1948 to 1978 for 30 years but was paid neither gratuity nor pension, nor provident fund, when she left on 14th September, 1978 ?

(*b*) will he cause an investigation to be made, and pay her a reasonable gratuity and her provident fund ?

(*c*) If not, why ?

රනිල් වික්‍රමසිංහ මහතා (යෞවන කටයුතු හා රැකියාව ඇමතිතුමා සහ අධ්‍යාපන ඇමතිතුමා)

(திரு. ரணில் விக்ரமசிங்ஹ — இளைஞர் அலுவல்கள், தொழில் வாய்ப்பு அமைச்சரும் கல்வி அமைச்சரும்)

(Mr. Ranil Wickremasinghe Minister of Youth Affairs & Employment and Minister of Education)

(අ) නො දනිමි.

(ආ) නැත.

(ඇ) මෙම ශිෂ්‍ය නිවාසය, මගේ අමාත්‍යාංශය යටතේ පවත්වා ගෙන යන ලද රජයේ ශිෂ්‍ය නිවාසයක් නොවන නිසා.

(அ) நான் அறியேன்.

(ஆ) இல்லை.

(இ) இஃது எனது அமைச்சின் பொறுப்பிலுள்ள ஓர் அரசாங்க விடுதியில்லை என்பதால்.

(*a*) I am not aware.

(*b*) No.

(*c*) As this is not a Govt. Hostel coming under the purview of my Ministry.

ඕ. ඩී. නන්දවතී මහත්මිය : වැන්දඹු විශ්‍රාමිකය

திருமதி ஓ. டி. நந்தாவதி : விதவை ஓய்வூதியம்

MRS. O. D. NANDAWATHIE : WIDOWS PENSION

168/84

ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා

(கலாநிதி டபிள்யு. தஹநாயக்க)

(Dr. W. Dahanayake)

ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ ගමනාගමන මණ්ඩල පිළිබඳ ඇමතිතුමා සහ පුද්ගලික බස් ප්‍රවාහනය පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) 1981 අප්‍රේල් මස මියගිය ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවා අංක 397 හිමිව සිටි කම්කරු බී. සර්ලේලිස් මහතාගේ වැන්දඹුව වන අහංගම කලටුවේ කහවත්තේගොඩ ඕ. ඩී. නන්දවතී මහත්මියට වැන්දඹු විශ්‍රාමිකය සහ වෙනත් ලැබීම් ගෙවීමට කටයුතු කරන්නේද ?

(ආ) නො එසේ නම්, ඒ මන්ද ?

போக்குவரத்து அமைச்சரும், போக்குவரத்து சபைகள் அமைச்சரும், தனியார் பஸ் போக்குவரத்து அமைச்சருமானவரைக் கேட்ட வினா :

(அ) 1981 எப்ரலில் மரணமடைந்த இலங்கை அரசாங்கப் புகையிரதப் பகுதி சிற்றாழியர் (சேவை இல. 397) திரு. பீ. சர்னேலிஸின் விதவை அஹங்கம, கலத்துவ, கஹவத்துகொடவில் வசிக்கும் திருமதி ஓ. டி. நந்தாவதிக்குரிய விதவை ஓய்வூதியமும் ஏனைய பாக்கிகளும் கொடுபட அவர் நடவடிக்கை எடுப்பாரா ?

(ஆ) இல்லையேல், ஏன் ?

asked the Minister of Transport and Minister for Transport Boards and Minister for Private Omnibus Transport :

(*a*) Will he cause the payment of widow's pension and other dues to Mrs. O. D. Nandawathie of Kahawattagoda, Kalutara, Ahangama, widow of the late Mr. B. Sarlis, labourer, service No. 397 of the C.G.R., who died in April, 1981 ?

(*b*) If not, why ?

එම්. එච්. මොහොමඩ් මහතා (ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමතිතුමා, ගමනාගමන මණ්ඩල පිළිබඳ ඇමතිතුමා සහ පුද්ගලික බස් ප්‍රවාහනය පිළිබඳ ඇමතිතුමා)

(ஜனாப் எம். எச். முஹம்மத் — போக்குவரத்து அமைச்சரும் போக்குவரத்துச் சபைகள் அமைச்சரும் தனியார் பஸ் போக்குவரத்து அமைச்சரும்)

(Mr. M. H. Mohamed–Minister of Transport, Minister for Transport Boards and Minister for Private Omnibus Transport)

(අ) ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවා අංක 397 හිමිව සිටි කම්කරු බී. සාර්ලිස් මහතාගේ වැන්දඹුව වන ඕ. ඩී. නන්දවතී මහත්මියට සහ සෙසු යැපෙන්නන්ට මරණ පාරිතෝෂිකය සහ වැන්දඹු සහ අනන්දරු විශ්‍රාමිකය ගෙවීමට කටයුතු කර ඇත.

(ආ) පැන නොනගී.

(*a*) Action has been taken to pay the death gratuity and Widow's and Orphans' Pension to Mrs. D. C. Nandawathie, widow and the dependents of the late Mr. B. Sarlis, Railway labourer, Service No. 397.

(*b*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පී. ජී. චන්ද්‍රසිරි මහතා : නැවත සේවයට ගැනීම
திரு. பீ. ஜி. சந்தாசிறி : நிரந்தர சேவையிலமர்த்தல்
MR. P. G. CHANDRASIRI : REINSTATEMENT

169/84

ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

ප්‍රවාහන කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ ගමනාගමන මණ්ඩල පිළිබඳ ඇමතිතුමා සහ පුද්ගලික බස් ප්‍රවාහනය පිළිබඳ ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) 1983.11.18 දිනැති අංක 408/83 දරන ප්‍රශ්නයට ලැබුණු පිළිතුරට යොමුව, පී. ජී. චන්ද්‍රසිරි මහතා, 1980 ජනවාරි මාසයේදී ස්ථිර සේවකයෙකු ලෙස පත්කරන ලද බව එතුමා දන්නේද ?

(ආ) මොහු දැන් අතිම් සේවකයකු වශයෙන් නැවත සේවයේ පිහිටුවා ඇති බව එතුමා දන්නේද ?

(ඇ) අනෙකුත් මේ හා සමාන සේවකයින්ට මෙන්, මොහුටත් සේවයේ ස්ථිරත්වය දැන් ලබා දෙන්නේද ?

(ඇ) එසේ නොකරන්නේ නම්, ඒ මන්ද ?

போக்குவரத்து அமைச்சரும், போக்குவரத்து சபைகள் அமைச்சரும், தனியார் பஸ் போக்குவரத்து அமைச்சருமான வரைக் கேட்ட வினா :

(அ) 18.11.83 ல் 408/83 ம் இலக்க வினாவுக்குத் தரப்பட்ட விடையின் பிரகாரம் திரு. பி. ஜி. சந்தாசிறி என்பவர் 1980 ஜனவரி தொடக்கம் நிரந்தர ஊழியராக் கப்பட்டுள்ளார் என்பதை அவர் அறிவாரா ?

(ஆ) இவருக்கு அமைய ஊழியராக மீள்வேலையளிக்கப்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா ?

(இ) இதனை ஒத்த ஏனையவற்றில் நடந்ததைப்போல இவருக்கும் நிரந்தர நியமனம் வழங்கப்படுமா ?

(ஈ) இல்லையேல், ஏன் ?

asked the Minister of Transport and Minister for Transport Boards and Minister for Private Omnibus Transport, :

(*a*) With reference to the reply to question No. 408/83 of 18.11.83, is he aware that Mr. P.G Chandrasiri was made a permanent worker in January, 1980 ?

(*b*) Is he aware that now he has been re-instated as a casual worker ?

(*c*) Will he be allowed permanancy now, as in other similar cases ?

(*d*) If not, why ?

එම්. එච්. මොහොමඩ් මහතා
(ஜனாப் எம். எச். முஹம்மத்)
(Mr. M. H. Mohamed)

(අ) පී. ජී. චන්ද්‍රසිරි මහතා 1980 ජනවාරි මසදී ස්ථිර සේවකයෙකු වශයෙන් පත් කරනු නොලැබිය.

(ආ) 1984. 05. 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, 1980. 07. 10 වන දින සේවය අතහැර යන අවස්ථාවේ දරූ ආදේශක සේවකයෙකු වශයෙන් නැවත සේවයේ පිහිටුවන ලදී.

(ඇ) ඔහු නැවත සේවයේ පිහිටවූ දින සිට ස්ථිර සේවකයෙකු වශයෙන් පත් කරනු ලැබේ.

(ඇ) පැන නොනගී.

(*a*) Mr. P. G. Chandrasiri was not made a permanent employee in January, 1980.

(*b*) He was re-instated as a Substitute Labourer, with effect from 31.05.1984 which was the post he held when he left service on 10.07.1980.

(*c*) He will be appointed as a permanent employee from the date he was re-instated in service.

(*d*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා සවකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මිත් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

1984 අගෝස්තු 21 වන අඟහරුවාද

තොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි

குறிப்பு

அங்கத்தினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

1984 ஓகஸ்ட் 21, செவ்வாய்க்கிழமைக்குப் பிந்தாமற்

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD

not later than

Tuesday, 21st August 1984

Contents of Proceedings	:	From 3.00 p.m. to 7.15 p.m. on 07.08.1984
Final set of manuscripts received from Parliament	:	10.30 p.m. on 07.08.1984
Printed copies despatched	:	08.08.1984 evening

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வொராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org